**වාරියපොළ ප්‍රාදේශීය සභාව.**
**කුරුණෑගල දිස්ත්‍රික්කය.**

**1. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 10 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

----------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වාරියපොළ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු රු. 70,000 ක් වූ ගල්කන්දේහේන වත්ත ස්ථාවර වත්කම් යටතේ දක්වා නොතිබුණි. | ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතු වේ. | පරීක්ෂාකර බලා ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු කරමි. |
| (ආ) | 2018 දෙසැම්බර් 28 දින සභාවට පරිත්‍යාග ලෙස ලද රු. 558,246 ක් වටිනා උපකරණ හා ගත්තිරියාව සායන මධ්‍යස්ථානය සඳහා මිලදීගෙන තිබූ රු.64,500 ක් වටිනා ලී බඩු උපකරණ ගිණුම්ගත කර නොතිබුණි. | පරිත්‍යාග හා මිලදී ගැනීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී මෙම තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර වත්කම් ලේඛනය අනුව ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති ශේෂයන් අතර රු.155,347 ක නොසැසඳීම් පැවතුණි. | අදාළ ශේෂ වල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී මෙම වෙනස නිවැරදි කිරීම සඳහා කටයුතු කරමි. |

**1.4** **අනුකූල නොවීම**

**නීති, රීති. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | රු. 446,560 ක් වැයකර වාහන 3 ක සිදුකරන ලද අලුත්වැඩියාවන් සඳහා ගරාජයේ මිල ගණන් වල සාධාරණත්වය සුදුසුකම්ලත් යාන්ත්‍රික ඉංජිනේරු වාර්තාවන් ලබාගෙන නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතු වේ. | මෙය ප්‍රමාද දෝෂයක් හා නවක නිලධාරීන්ගේ නොදැනුවත්කම නිසා සිදු වී ඇත. ඉදිරියට එවැනි තත්වයන් ඇති නොවන බවට වග බලා ගෙන ඇත. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.75,100,312 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 75,388,022 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**2.2.1** **ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 වර්ෂය | | | | 2017 වර්ෂය | | | |
| --- | --- | --- | --- | --- | --- | --- | --- | --- |
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු000. | රු000. | රු000. | රු000. | රු000. | රු000. | රු000. | රු000. |
| I. වරිපනම් හා බදු | 5,546 | 6,556 | 5,957 | 599 | 5,169 | 6,619 | 6,065 | 555 |
| II. කුලී | 10,360 | 11,050 | 11,028 | 21 | 9,889 | 10,605 | 10,603 | 2 |
| III. බලපත්‍ර ගාස්තු | 1,247 | 1,109 | 1,109 | - | 772 | 1,189 | 1,189 | - |
| IV. වෙනත් ආදායම් | 33,485 | 39,362 | 38,607 | 755 | 168,084 | 214,641 | 177,085 | 36,750 |
| එකතුව | 50,638 | 58,077 | 56,701 | 1,375 | 183,914 | 233,054 | 194,942 | 37,307 |

**2.2.2** වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.478,683 ක් වූ වරිපනම් බදු හිඟය තුළ වසරකට වඩා වැඩි රු.237,614ක ශේෂයක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී ඒ සියළු දේපළ තහනමට ගැනීමට කටයුතු කරමි. |

**2.2.3** උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.3,258,518ක් හා මුද්දර ගාස්තු රු. 26,149,299 ක් විය. | හිග මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කාර්යය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුඛවිහරණය හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** **අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

යුතු නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් එක් කාරණයක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

**(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඇස්තමේන්තු වටිනාකම රු 1,000,000 ක් වූ හොරොම්බුව වොලිබෝල් ක්‍රීඩාංගනය ඉදිකිරීම සඳහා 2019 අප්‍රේල් 03 දින ගිවිසුම් අත්සන් කර මාස 03 ක් ඇතුළත අදාළ කාර්යය නිමකළ යුතු වුවද, 2018 දෙසැම්බර් 31 දින වන විටත් වැඩ ආරම්භකර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව අදාළ කාල පරිච්ඡේදය තුළ කාර්යය නිමකිරීමට කටයුතු කළ යුතු වේ. | පළාත් නිශ්චිත ප්‍රතිපාදන යටතේ වෙන්කළ රු.2,000,000 ක ප්‍රතිපාදන ලැබීම මේ වන විට අවිනිශ්චිත තත්වයකට පත්ව ඇති නිසා සහා අරමුදලින් වියදම් දැරීමට යටත්ව ගිවිසුම් ගතවී ඇති බැවින් එම වැඩ කොටස් ආරම්භ කිරීමට සූදානම් කර ඇත. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව තිරසර සංවර්ධන න්‍යායපත්‍රය 2030 පිළිබඳව දැනුවත්ව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක 9 ක් හඳුනාගෙන පැවතියද ඊට අදාල දර්ශක හඳුනාගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් රු. 20,092,631 ක් වැය කර ව්‍යාපෘති 03ක් ක්‍රියාත්මක කර තිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකිරීමට ක්‍රියාකළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට වසරකට වැඩි කාලයක සිට අයවීමට ඇති රු. 41,406,228 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (ආ) විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු වසර 05 ක් ඉක්ම වූ රු. 3,023,778 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

### 3.3.1 සේවක පුරප්පාඩු හා අතිරික්තතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනුමත මණ්ඩලය තුළ ද්විතියික තනතුරු පුරප්පාඩු 5 ක් හා ප්‍රාථමික තනතුරු 15 ක අතිරික්තයක් පැවතුණි. | පුරප්පාඩු පිරවීමට හා අතිරික්ත සේවකයින් විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ද්විතීයික තනතුරු පුරප්පාඩු බඳවා ගැනීම සඳහා අදාළ ආයතන වෙත දන්වා ඇත. ප්‍රාථමික තනතුරු 15 ක අතිරික්තයක් ලෙස සඳහන් කරඇත්තේ 25/2014 චක්‍රලේඛය යටතේ බඳවාගෙන අනුමැතියට යවා ඇති නමුත් තවම අනුමැතිය ලැබී නොමැති තනතුරුය. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බස්නැවතුම්පල බිම් මහල අංක 01 කඩ කාමරය බදුකරු විසින් රු.225,000 ක් වැයකර ඉදිකිරීම් සිදුකර තිබුණු අතර ඒ සඳහා සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. තක්සේරු වාර්තාව අනුව එම කඩකාමරයේ කුලිය රු.8000 ක් වුවද රු. 6000 ක මාසික කුලියක් අයකර තිබුණි. | තක්සේරු කුලිය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මගේ අංක 04/02/109/19 සහ 2019.04.10 දිනැති ලිපියෙන් තක්සේරුව ඇතුලත් කිරීම සඳහා ප්‍රධාන තක්සේරුකරුගෙන් ඉල්ලීමක් කර ඇත. |

**3.5 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වයඹ පළාතේ පළාත් පාලන ආයතනවල සේවා අවශ්‍යතාවය සඳහා උපදේශක ඉංජිනේරුවරුන් ලෙස ඉංජිනේරු සේවයේ නිලධාරීන් 03 දෙනෙකු ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් අංක ව/ප්‍රාලේ/3/1/2/1 හා 2008 මැයි 06 දිනැති ලිපිය මගින් අනුමත නිලධාරියෙකු විශ්‍රාම ගියද එම දීමනා ලබාගත හැකි බව සඳහන් කර නොතිබියදී 2018 වර්ෂයේ ගිවිසුම් ගත වීමකින් තොරව වර්තමානය වන විට විශ්‍රාම ගොස් සිටින එක් නිලධාරියෙකුට ව්‍යාපෘතියේ සැලසුම් සැකසීම සඳහා උපදේශන ඉංජිනේරු දීමනා ලෙස රු. 809,168 ක් ගෙවා තිබුණි. | ප්‍රධාන ලේකම්වරයාගේ උපදෙස් පරිදි ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුවේ. | විශ්‍රාම ගිය ඉංජිනේරුවරුන්ගේ සේවාව ලබාගැනීම අත්හිටුවන ලෙසට කිසිදු නියෝගයක් ප්‍රධාන ලේකම් නිකුත් කර නැත. අප විසින් යොදවාගෙන සිටි නිලධාරී හා උපදේශක ඉංජිනේරුවරයා ලෙස කටයුතු කළ නිසා ඒ මහතාගේ සේවාව දිගටම ලබාගත් බව සඳහන් කරමි. |

| | | |
|---|---|---|
| (ආ) වයඹ පළාත් පාලන ආයතනවල සේවා අවශ්‍යතාව සඳහා උපදේශක ඉංජිනේරුවරුන් ලෙස ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් නම් කර නොතිබූ ඉංජිනේරුවරයෙකුට රු. 98,736ක් ගෙවා තිබුණි. | ප්‍රධාන ලේකම්වරයාගේ උපදෙස් පරිදි ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුවේ. | එම ඉංජිනේරු මහතා සුදුසුකම්ලත් වරලත් ඉංජිනේරුවරයෙකු වන නිසා සහා තීරණයක් මත එම සේවාව ලබා ගැනීමට කටයුතු කළ බව සඳහන් කරමි. |

**3.6 වත්කම් කළමනාකරණය**

**3.6.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රධාන ලේකම් කාර්යාලයට අයත් රු. 458,163 ක් වටිනා කැබ් රථයක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රධාන ලේකම්ගේ උපදෙස් මත කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

**3.7 ප්‍රසම්පාදනය**

**කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහල් 03 කින් යුතු කටුපොත බහුකාර්ය ගොඩනැගිල්ලේ මහල් 02 ක් ඉදි කිරීම සඳහා ගිවිසුම්ගත රු. 47,321,534 ක වටිනාකමකට 2017 නොවැම්බර් 20 දින සිට ප්‍රායෝගිකව ප්‍රමාණවත් නොවූ මාසයක කාලයක් ලබා දී තිබුණ ද 2019 ජනවාරි 08 වන විටද ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මෙම ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ලබාදෙන ලද්දේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය මගිනි. ප්‍රතිපාදන වෙන්කර තිබුණේ 2017 වර්ෂයේ වූ නිසා ගිවිසුම් කාලය එසේ අඩුවෙන් සඳහන් කිරීමට සිදුවූ අතර එය ප්‍රායෝගික නොවන බව පිළිගනිමි. |